# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 10 /2019

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2019 ඔක්තෝම්බර් මස 18 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම</u>

ලිපිකරු III ශ්‍රේණිය සහ කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරුවල අනුමත බඳවා ගැනීමේ පරිපාටි සහ 1979.11.27, 1998.09.15, 2016.10.04 සහ 2018.07.16 දිනැති පිළිවෙලින් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 50, 742, 15/2016 සහ 06/2018 වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

2. 2018.08.01 දින සිට ක්‍රියාත්මක වූ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2018 හඳුන්වාදීමත් සමඟ පරිගණක යෙදවුම් සහකාර, ලිපිකරු, යතුරු ලේඛක සහ ලඝුලේඛක යන තනතුරු දරන්නන් කළමනාකරණ සහකාර තනතුර ට අන්තර්ග්‍රහණය කරන ලදී. ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින්ට කළමනාකරණ සහකාර තාක්‍ෂණික නොවන කාණ්ඩයට ඇතුළුවීම සඳහා වෙන් කර ඇති ක්‍රියාපරිපාටිය එලෙසම පවත්වාගෙන යන අතර ම, කොමිෂන් චක්‍රලේඛ අංක 50 මගින් දක්වා ඇති ලිපිකරු III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ පරිපාටි වල හා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 15/2016 මගින් නිකුත් කර ඇති කළමනාකරණ සහකාර III ශ්‍රේණියට අදාළ බඳවා ගැනීමේ පරිපාටි වල එම තනතුර සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් වල වෙනස්කම් පවතී.

3. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 15/2016 අහෝසි කරමින් නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2018 ප්‍රකාරව, කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ ඇති පුරප්පාඩු සංඛ්‍යාවෙන් 30% ක් ප්‍රාථමික ශ්‍රේණි සේවකයින් පත් කිරීම සඳහා වෙන් කළ යුතුය. තවද, අදාළ දිනයට ප්‍රථම, ප්‍රාථමික ශ්‍රේණිවල ස්ථිර පත්වීමක අවම වශයෙන් වසර 5 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2018 මගින් නියම කර ඇති අනෙකුත් අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇත්නම් ඔවුනට සීමිත කාණ්ඩය යටතේ කළමනාකරණ සහකාර III ශ්‍රේණිය සඳහා අයදුම් කළ හැකිය.

4. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 50 මගින් දක්වා ඇති විධිවිධානවලට අනුව, ප්‍රාථමික ශ්‍රේණියවල ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 3 ක සතුටුදායක සේවාවක් සපුරා ඇති සේවකයින්ට එහි දක්වා ඇති අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් ලිපිකරු III ශ්‍රේණියේ තනතුර සඳහා අයදුම් කළ හැකිව තිබුණි.

5. ලිපිකරු III ශ්‍රේණිය සහ කළමනාකරණ සහකාර III ශ්‍රේණිය යන තනතුරු සඳහා ඇති එක් එක් බඳවා ගැනීමේ පරිපාටිවල නියම කර ඇති අනෙකුත් සුදුසුකම් සහ සේවා පළපුරුද්ද පිළිබඳ වෙනස් වූ අවශ්‍යතා පිළිබඳ සළකා බැලූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව **2019** මැයි මස **23** වන දින පැවැති එහි **1010** වැනි රැස්වීම් වාරයේදී, කළමනාකරණ සහකාර **III** ශ්‍රේණියේ වෙන් කර තබන ලද පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින් එම තනතුරට **(U-PL කාණ්ඩය)** පත්වන අවස්ථාවේදී, ලිපිකරු **III** ශ්‍රේණිය තනතුරට බඳවා ගැනීම සඳහා ඔවුන් වෙතින් බලාපොරොත්තු වූ සේවා පලපුරුද්දට අදාල අවශ්‍යතාවය සලකා බලමින් එලෙස සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කරන ලදී.

6. ඒ අනුව, කොමිෂන් සභා චක්‍රලේඛ අංක 50 සහ 742 ප්‍රකාරව 2015.01.01 දින සිට 2019.10.02 දක්වා කාල සීමාව තුළ සුදුසුකම් ලබා ඇති ප්‍රාථමික ශ්‍රේණිවල සේවකයින්ගෙන්, කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා අයදුම්පත් කැඳවීමට ඉහත සඳහන් කොමිෂන් සභා සැසිවාරයේදී, අනුමැතිය ලබා දෙන ලදී. තවද, ඉහත චක්‍රලේඛ විධිවිධාන අනුව කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුර සඳහා මෙම සේවකයින් සලකා බැලීමට තීරණය කර ඇත්තේ එම තනතුර සඳහා වෙන් කරන ලද පුරප්පාඩු පිරවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන **ඊළඟ ආසන්නතම බඳවා ගැනීම් දෙක සඳහා පමණි.**

7. එම බඳවා ගැනීමේ ක්‍රියාවලියෙන් සාර්ථක නොවන හෝ මොනයම් හේතුවක් මත හෝ ඉහත එක් එක් බඳවා ගැනීම් ක්‍රියාවලියන්හි එක් කොටසකට හෝ සම්පූර්ණ ක්‍රියාවලියට සහභාගී නොවන හෝ ප්‍රාථමික ශ්‍රේණි සේවා කාණ්ඩයේ (U-PL කාණ්ඩය) තනතුරකට 2016.02.03 දින හෝ ඉන් පසුව බඳවා ගන්නා ලද සේවකයින්, **2018.07.16** දිනැති කොමිෂන් චක්‍රලේඛ අංක **06/2018** ප්‍රකාරව **කළමනාකරණ සහකාර III ශ්‍රේණිය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.**

8. ඔබගේ උසස් අධ්‍යාපන ආයතනයේ අදාළ සේවකයන්ව මේ සම්බන්ධව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරණ මෙන් කාරුණිකව දන්වමි.

අ.කළේ. මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත් :

1. ලේකම්/ නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංක: යූජීසී/එච්ආර්/3/6/එම්/2019